(06)

1107

මගේ අංකය - අනු/6/1/iv/1/7
ප්‍රාදේශිය ලේකම් කාර්යාලය,
ගලෙන්බිඳුණුවැව,
2018.10.30

1 9 NOV 2018

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අනුරාධපුර.

**2018/2019 - මහ වගා කන්න රැස්වීම සංශෝධිත තීරණ දැනුම් දීම.**
**හුරුළුවැව මහ ගොවි ජනපද ව්‍යාපාරය 2018.10.09**

1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධිත) පනතේ අංක 5 වගන්තියේ 5 වන උප වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටි හුරුළුවැව මහ ගොවිජනපද ව්‍යාපාරයේ 2018/2019 මහ කන්න වගා කිරීමට අදාළව කන්න රැස්වීම(2වන වර) 2018.10.09 දින පෙ.ව 10.00ට පමණ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාවේ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් ලේකම් ජී.ඩී.කීර්ති ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් හා ගලෙන්බිඳුණුවැව සහකාර ප්‍රාදේශිය ලේකම් එල්.එම්.පී.ගුණතිලක මහතා ඇතුළු රාජ්‍ය නිලධාරීන් 87 දෙනෙකු හා ගොවි සංවිධාන සාමාජිකයින් 103 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. මෙම සභාවේ දී සම්මත කර ගනු ලැබූ වගා සැලැස්ම, කාල සටහන හා වෙනත් තීරණ ගොවීන්ගේ, අදාළ රාජ්‍ය නිලධාරීන්ගේ හා අනෙකුත් අයගේ දැන ගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.
න්‍යාය පත්‍රානුකූලව ප්‍රථමයෙන් ආගම සිහි කිරීමෙන් අනතුරුව සහකාර ප්‍රාදේශිය ලේකම් විසින් පැමිණ සිටි සියලුම නිලධාරීන් හා ගොවි සාමාජිකයින් පිළිගනිමින් සභාවේ මූලාසනය අතිරේක දිස්ත්‍රික් ලේකම් වෙත පිළිගැන්වීමෙන් පසුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

| අනු අංකය | කරුණු | වගකීම |
|---|---|---|
| 01. | **වාරිමාර්ග කටයුතු**<br>**වාරිමාර්ග දෙපාර්තමේන්තුව**<br>• වැවේ පවතින ජල තත්වය -අඩි 16.65 , අක්.අඩි 23712.5<br>• සක්‍රීය ජල ධාරිතාවය - අක්.අඩි 21712<br>• මුළු ජල අවශ්‍යතාවය - අක්.අඩි 44200<br>• දැනට පවතින ජල ප්‍රමාණය අනුව නිර්දේශ කළ හැකි ප්‍රමාණය - අක්කර 5712<br>• දැනට පවතින ජල ප්‍රමාණය අනුව මහවැලියෙන් අවශ්‍ය ජල ප්‍රමාණය - අක්.අඩි 20000 | විජිත් කොඩිතුවක්කු මයා, වාරිමාර්ග ඉංජිනේරු,ප්‍රාදේශිය වාරිමාර්ග කාර්යාලය,ග/වැව |
| | • ඉගිනිමිටිය ව්‍යාපාරයේ ජලය හිග කන්නයකදී නිසි ජල කළමණාකරණයකින් යුතුව සාර්ථකව කන්න වගා කළ බව පෙන්වා දෙන ලදී.<br>• ඒ අනුව හුරුළු ව්‍යාපාරයේ කටයුතු කරන්නේනම් අඩු ජල ප්‍රමාණයකින් වගා කළ හැකි බව සංඛ්‍යාත්මකව පෙන්වා දෙන ලද අතර හැකි ඉක්මනින් වර්ෂා ජලයෙන් වගා කටයුතු ආරම්භ කරන ලෙස.<br>• හුරුළු පෝෂිත ඇලේ ඒකාබද්ධ කළමණාකරණ කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ඉල්ලුම් කරන ජල ප්‍රමාණය මහවැලියෙන් ලබා දීමට කටයුතු කරන බව. | ඩබ්.ජී.ඥානදාස මයා, අධ්‍යක්ෂ,වාරිමාර්ග තාක්ෂණ සේවා |

| | | |
|---|---|---|
| | • හුරුළු වැවට ජලය ලබා ගැනීම සදහා වාරිමාර්ග හා ආපදා කළමණාකරණ අමාත්‍යතුමාගේ සහයෝගය ලබා දුන් අතර ඉදිරියේ දි ද එම සහයෝගය නොමදව ලබා දෙන බව. | ප්‍රියන්ත ජයතිස්ස මයා,වාරිමාර්ග හා ආපදා කළමණාකරණ ගරු අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්. |
| 02. | **<u>බැංකු ආයතන අදහස් දැක්විම</u>**<br>• ඔක්තෝම්බර් 01සිට වගා ණය නිකුත් කරන බව.<br>• ණය ලබා ගැනීම සදහා කෘෂි රක්ෂණ මණ්ඩලයෙන් ලබා ගන්නා රක්ෂණ රිසිට්පත අවශ්‍ය බව.<br>• ඇපකරුවන් දෙදනෙකු අවශ්‍ය බව.<br>• ණය ලබා ගන්නා පුද්ගලයා ණය තොරතුරු කාර්යාංශයේ ණය නොගෙවන්නන්ගේ ලේඛණයේ නොසිටිය යුතුය.<br>• වගා කටයුතු සිදු කිරිම සදහා ණය ලබා ගන්නා බවට කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර සහතික කළ ලිපියක් අවශ්‍ය බව. | ලංකා බැංකුව/මහජන බැංකුව, ගලෙන්බිදුණුවැව. |
| 03. | **<u>ගොවි සංවිධාන අදහස් දැක්වීම.</u>**<br>• කන්න රැස්වීමේ දී ගත් තීරණ තව දුරටත් වඩාත් ඵලදායීව යොදා ගැනීම සදහා සංශෝධනය කර නැවත තීරණයක් ගැනීම සුදුසු බව. | උපාලි ඒකනායක මයා, හුරුළුවැව ඒකාබද්ධ ගොවි .සං |

04 **කන්න රැස්වීම් තීරණ සංශෝධනය කර තීරණ වලට එළඹීම.**

- 0 වගා කළ යුතු බිම් ප්‍රමාණය - සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය(අක්කර 10400)
- වගා කරන බෝගය සහ වයස:- වී හා අතිරේක බෝග (මාස 3 ½ ,3)
- ගොවීන් විසින් ඇළ වේලි සුද්ද කිරීමේ අවසන් දිනය - 2018.10.15ට පෙර
- සුද්ද නොකළ කොටස් ගොවි සංවිධාන විසින් සුද්ද කිරිම.2018.10.18ට පෙර
- ජලය නිකුත් කිරීම යෝජිත දිනය - 2018.10.18
- වගාව පිහිටුවීම ආරම්භ කළ යුතු දිනය:-2018.10.18
- වගාව පිහිටුවා අවසන් කළ යුතු දිනය:- 2018.11.08
- ට්‍රැක්ටර් යායෙන් ඉවත් කළ යුතු අවසන් දිනය - 2018.11.08
- මුර ජලය නිකුත් කිරීමේ ආරම්භක දිනය - 2018.11.10
- වගාව රක්ෂණය කර අවසන් කළ යුතු දිනය- 2018.11.08ට පෙර
- මුර ජලය නිකුත් කිරීමේ අවසන් දිනය - 2019.02.06
- වගා හානි දැනුම් දීමේ අවසන් දිනය - 2019.02.06
- නැවත ට්‍රැක්ටර් යායට ඇතුලත් කළ යුතු දිනය 2019.02.06
- අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය - 2019.02.28
- වාරි නිර්මිතවලට හානි කිරීමේ දඩය- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව
- සංවර්ධන අරමුදල් - අක්කරයට රු.300.00
- ඇළ වේලි සුද්ද නොකිරීමේ දඩය - බඹයකට රු.100.00

**දිස්ත්‍රික් ලේකම්තුමාගේ අදහස් දැක්වීම.**

- ජලය නිසි පරිදි කළමණාකරණය කරගෙන වගා කටයුතු සිදු කරන ලෙස.
- ගත් තීරණ වලට අනුව කන්නයේ වගා කටයුතු නිසි පරිදි සිදු කරන ලෙස.
- කන්න තීරණ සම්බන්ධයෙන් කඩිනමින් ගොවි මහතුන් දැනුවත් කිරීම සිදු කරන ලෙස.

කන්න රැස්වීම තීරණ සංශෝධනය කර ගැනීම සඳහා සහභාගි වූ සියළුම දෙනාට ස්තූතිය පුද කරමින්,එළඹෙන කන්නය සාර්ථක කර ගැනීම සඳහා ගොවි මහතුන්ට සුභ පතමින් සභාවේ වැඩ කටයුතු අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමා විසින් අවසන් කරන ලදී.

මාලනී පී. කුඹුරගේ
ප්‍රාදේශීය ලේකම්
ගලෙන්බිඳුණුවැව

ප්‍රාදේශීය ලේකම්,
ගලෙන්බිඳුණුවැව

**පිටපත්:-**

1. අධ්‍යක්ෂ,වාරිමාර්ග කළමනාකරණ අංශය,කොළඹ
2. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්,අනුරාධපුර
3. කලාපීය වාර්මාර්ග අධ්‍යක්ෂ,අනුරාධපුර
4. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ(අන්තර් පළාත්)අනුරාධපුර
5. වාරිමාර්ග ඉංජිනේරු,ඉංජිනේරු සහකාර(වැඩ පරිපාලන)වාරිමාර්ග ජල පාලකවරු -හුරුළුවැව
6. නේවාසික ව්‍යාපෘති කළමනාකරු,හුරුළුවැව
7. ගොවිජන සේවා ප්‍රාදේශිය නිලධාරී,ගලෙන්බිඳුණුවැව/යකල්ල
8. මූලස්ථාන කෘෂිකර්ම උපදේශක,ගලෙන්බිඳුණුවැව
9. සහකාර අධ්‍යක්ෂක, කෘෂි රක්ෂණ මණ්ඩලය -[illegible]
10. ප්ලේන්ට් ෆුට් සමාගම/කේ.එස්.ටී සමාගම
11. ගොවි සංවිධාන සභාපති ,ලේකම්